වරකාපොල ප්‍රාදේශීය සභාව
කෑගල්ල දිස්ත්‍රික්කය

1 මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 31 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 ජූනි 26 දිනද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2018 දෙසැම්බර් 31 දිනට වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
----------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී ඉවත් කරන ලද ස්ථාවර වත්කම්වල පිරිවැය හඳුනානොගෙන රු. 220,076 ක් වූ විකිණීමෙන් ලද මුදල පමණක් ගිණුම්ගත කර තිබුණි. | ස්ථාවර වත්කම් ඉවත් කිරීම නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. | පිළිගනිමි. ඉදිරියේදී නිවැරදිව ගිණුම්ගත කරමි. |

(ආ) නොසැසඳුනු ගිණුම්
----------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් ගිණුම් විෂයයන් 17 ක ශේෂවල හා අදාල උපයෝගී ලේඛනවල ශේෂ අතර රු.45,767,064 ක වෙනසක් විය. | ගිණුම් ශේෂ සහ උපයෝගී ලේඛණ අතර වෙනස්කම් සසඳා නිවැරදිකළ යුතුවේ. | ලේඛණ නඩත්තුවේ පවතින දෝෂ හා සේවක ණය, පොදු තැන්පත් ලේඛණ වර්ෂ ගණනාවක සිට නිවැරදිව තුලනය නොවීම නිසා මෙලෙස මූල්‍ය ප්‍රකාශන වල සහ උපලේඛණ වල වෙනසක් පවතී. වාර්ෂිකව නිවැරදි ලෙස උපලේඛණ ඉදිරියට ගෙන ඇතත් පෙර සිට පැවත එන ශේෂ වල නොගැලපීමක් දක්නට ඇත. පෙර වර්ෂවල ශේෂයන් පිළිබඳව ආපසු සොයා බලා නිවැරදි කිරීමට උපදෙස් දුනිමි. |

1.4 අනුකූල නොවීම

--------------------

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි හා කලමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේනිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| | | රු. | | | |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | | |
| | (i) මුදල් රෙගුලාසි 396 (ඇ) | 154,010 | නිකුත්කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකරන ලද වලංගු කාලය මාස 06 ඉක්ම වූ චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මාරු නොවූ චෙක්පත් ආදායමට ගැනීමට කටයුතු කරමින් සිටින බව කාරුණිකව දන්වා සිටිමි. |
| | (ii) මුදල් රෙගුලාසි 571 | 531,608 | වර්ෂ දෙක ඉක්මවූ තැන්පත් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2015 දෙසැම්බර් 31 දක්වා තැන්පතු ආදායමට ගෙන ඇති අතර 2016 දෙසැම්බර් 31 දක්වා තැන්පත් කරන ලද තැන්පත් ආදායමට ගැනීම සඳහා විෂයභාර නිලධාරීන් වෙත ලිපි මඟින් දැනුවත් කර ඇති අතර ආදායමට ගත හැකිද යන්න විෂයභාර නිලධාරීන්ගෙන් තොරතුරු ලද වහාම ආදායමට ගැනීමට කටයුතු කරමි. |
| | (iii) මුදල් රෙගුලාසි 1646 | | සභාවේ වාහන 06 කට අදාල ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 වර්ෂයට අදාලව සභාව සතු සියලුම වාහනවල දෛනික ධාවන සටහන් සාරාංශ සටහන් සකස් කර ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරමි. |
| (ආ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | | වසර 05 කට වරක් සිදුකළ යුතු වරිපනම් තක්සේරුව 2007 වර්ෂයෙන් පසුව සිදුකර නොතිබුණි. | චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | නව තක්සේරුවක් සිදු කිරීම සඳහා පැමිණෙන ලෙස දන්වා තක්සේරු දෙපාර්තමේන්තුවට කිහිපවරක් ලිපි යවා ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 22,730,526 ක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 33,905,666 ක් විය.

2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| කාලය සොයාගත නොහැකි, වර්ෂයක කාලයක් හා වර්ෂ 11 ක කාලයක් ඉක්මවූ රු .15,346 ක් වටිනා අගරු චෙක්පත් 04 ක් හඳුනාගෙන නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි . | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නිරවුල් කර ගත යුතුය. | 2007 වර්ෂයේ අගරු වූ චෙක්පත් දෙක හා කාලය සොයාගත නොහැකි චෙක්පත පිළිබඳ සොයා කටයුතු කරන අතර 2017 වර්ෂයේ චෙක්පත පිළිබඳ හැකි ඉක්මනින් කටයුතු කරන බව දන්වා සිටිමි. |

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කල ආදායම | රැස්කල ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 5,987,000 | 6,233,093 | 4,305,107 | 1,927,985 | 5,987,000 | 6,381,490 | 4,638,168 | 1,743,322 |
| කුලී | 5,325,000 | 4,909,288 | 4,151,669 | 757,619 | 6,637,000 | 4,760,666 | 4,408,087 | 352,579 |
| වෙනත් ආදායම් | 94,059,000 | 89,694,058 | 5,850,309 | 36,843,670 | 80,865,000 | 82,414,946 | 47,829,284 | 34,585,662 |

2.3.2 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| (අ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.5,703,676 ක් වූ වරිපනම් හා අක්කර බදු හිඟ ශේෂය අය කර ගැනීමට සභාව කටයුතු කර | හිඟ ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | හිඟ වරිපනම් බදු මුදල අඩුකර ගැනීම සඳහා විවිධ ක්‍රියා මාර්ග ගන්නා ලද අතර ඒ අනුව තවදුරටත් අයකළ යුතු හිඟ වරිපනම් බදු මුදල |

| | | |
|---|---|---|
| නොතිබුණි. | | රු. 4,254,399.82 ක් දක්වා අඩු වී ඇත. |
| (ආ) සභා බල ප්‍රදේශයේ අක්කර බදු අයකරගත හැකි ඉඩම් හඳුනාගෙන ලේඛන සංශෝධනය කර ආදායම් රැස්කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් රැස්කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සතොයක්ෂණ කටයුතු සිදු කර ආදායම් අයකර ගැනීමට කටයුතු කරන ලෙසඋපදෙස් දුනිමි. |

2.3.3 වෙනත් ආදායම්

-----------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 04 න් ගාස්තු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් රැස් කර ගැනීමට කටයුතු කළ යුතුය. | සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි ගාස්තු අයකරගෙන නොමැති හෝටල් 04 හිඟ ගාස්තු සමඟ මෙම වසරේදී අයකර ගැනීමට කටයුතු සිදු කරයි. |
| (ආ) සමාලෝචිත වර්ෂය අවසානයට පරිසර බලපත්‍රවල වලංගු කාලය ඉක්මවූ ආයතන 18 කින් රු.78,000 ක් අයවිය යුතුව තිබුණි. | හිඟ පරිසර බලපත්‍ර ගාස්තු අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ | කල් ඉකුත් වූ සෑම ආයතනයකට ම බලපත්‍ර කාලය දීර්ඝ කරන ලෙස සිහි කැඳවීම් ලිපි යවා ඇති අතර බලපත්‍ර ලබා ගැනීමට පැමිණි ආයතන වල මහජන සෞඛ්‍ය පරීක්ෂක වාර්තාව ලබා දෙන ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි වෙත 2019 ජනවාරි 30 හා 2019 මැයි 06 වන දින ලිපි යවා ඇත. |

2.3.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු

-----------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 9,763,241 ක් හා මුද්දර ගාස්තු රු. 21,372,995 ක් විය. | ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු අයකර ගත යුතුවේ. | 2018 ජූලි මාසය දක්වා උප ලේඛන සකස් කර යවා ඇතත් මේ දක්වා මුදල් ලැබී නොමැත. |

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

3.1 කාර්ය සාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා

සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉටු කල කාර්යයන් දැක්වෙන ප්‍රගති වාර්තා පිළියෙල කර නොතිබීම හේතුවෙන් අපේක්ෂිත ඉලක්කයන් ළඟා කර ගැනීම පරික්ෂා කළ නොහැකි විය. | සැලැස්මට අනුව ඉටුකළ කාර්යයන්වල ප්‍රගතිය පිළිබඳ වාර්තා පිළියෙල කළ යුතුය. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය විමසීම සඳහා ක්‍රියාකාරී සැලැස්ම ඡායා පිටපත් කර අංශ ප්‍රධානීන් වෙත ලබා දී ඇති අතර එහි ප්‍රගතිය විමසීම අංශ ප්‍රධානීන් විසින් අදාල විෂයන්ගෙන් මේ වන විටද ලබා ගනිමින් පවතී. |

3.2 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අනුමත කාර්ය මණ්ඩලය තුල සේවක අතිරික්තතා 05 ක් හා පුරප්පාඩු තනතුරු 15 ක් වූ අතර සභාවේ ලේකම් තනතුර හා තාක්ෂණ නිලධාරී තනතුරක් පුරප්පාඩු වලට ඇතුලත් වී තිබුණි. | පුරප්පාඩු පිරවීමටත් අතිරික්ත සේවකයින් විධිමත්කර ගැනීමටත් කටයුතු කළ යුතුය. | ආයතනයේ පුරප්පාඩු තනතුරු සඳහා විටින් විට ලිඛිතව හා වාචිකව දැනුවත් කිරීම් කළද ආදායම් පරීක්ෂක තනතුරු 2 සඳහා නිළධාරීන් ලද අතර අනෙක් පුරප්පාඩු සඳහා මේ වන තෙක් නිළධාරීන් ලැබී නොමැත. මෙම ආයතනයේ කටයුතු විශාල බල ප්‍රදේශයක් තුළ විහිදී ඇති අතර එම කාර්යයන් කිරීම සඳහා අතිරික්ත සේවකයින් ආයතනයේ සේවා අවශ්‍යතා මත බඳවාගැනීම් සිදු කර ඇත. |

3.3 වත්කම් කළමනාකරණය

3.3.1 නඩත්තු හා අළුත්වැඩියා කටයුතු නොකිරිම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පොදු වැසිකිළි හා ආදාහනාගාර නඩත්තුව සඳහා 2018 වර්ෂයේ අයවැය ලේඛනය මඟින් එකතුව රු.450,000 ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණද අදාල නඩත්තු කටයුතු ඉටුකර නොතිබුණි. | වඩාත් ප්‍රායෝගිකව හා සැළසුම් සහගත ලෙස අයවැය ප්‍රතිපාදන වෙන් කර ගත යුතුවේ. | හදිසි නඩත්තු කටයුතු කිරීමට සිදු වේ යැයි අපේක්ෂා කර අයවැයෙන් ප්‍රතිපාදන වෙන් කළද නඩත්තුවක් සිදු නොකළ බැවින් මෙසේ මුදල් ඉතිරි වී ඇත. සුසාන භූමි වටා කම්බි ගැසීම සඳහා 2018 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර තිබුණද සුසාන භූමි ගැසට් කර නොතිබිණි. එබැවින් මෙම |

| | | |
|---|---|---|
| | | වර්ෂයේ සුසාන භූමි මායිම් ගල් සාදා මැණුම් කර අමාත්‍යවරයාගේ අනුමැතියට යැවීමට කටයුතු සිදු කරමින් සිටී. |

3.3.2 වත්කම්වලින් ආදායම් ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව සතුව පවතින පොදු වැසිකිලි 05 ක් ටෙන්ඩර් කර හෝ සභාව විසින් නඩත්තු කර හෝ මහජනයාට පාවිච්චි කල හැකි ආකාරයට පවත්වා ගෙන ගොස් නොතිබුණි. | මහජන සුභසාධනය සැලසෙන පරිදි කටයුතු කළ යුතුවේ. | මහජනයාට පාවිච්චි කළ හැකි ආකාරයට වැඩිදියුණු කර පොදු වැසිකිළි 05 ටෙන්ඩර් කළ ද කිසිවෙක් ටෙන්ඩරයන් ලබා ගෙන නැත. |

3.3.3 පවරා නොගත් වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ප්‍රාදේශීය සභාව සතු සුසාන භූමි 85 න් 65 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සුසාන භූමි පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | බල ප්‍රදේශයේ පවත්නා සුසාන භූමි 85 න් සභාව සතු සුසාන භූමි ලෙස වත්කම් ලේඛනයේ සටහන්ව ඇත්තේ 20 ක් පමණි. ඉතිරි සුසාන භූමි 65 හි අයිතිය ප්‍රාද්ශීය ලේකම් සතුවන අතර ඒවායේ අයිතිය පවරා ගැනීමට ඉල්ලීමක් කර ඇතත් මෙතෙක් අයිතිය සභාවට භාර දීමට කටයුතු කර නොමැති බැවින් ඉදිරි කටයුතු කිරීමට නොහැකි වී ඇත. |

3.3.4 නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ රු. 2,165,800 කට මිළදී ගත් ට්‍රැක්ටරය රියදුරකු නොමැති වීම නිසා සමාලෝචිත වර්ෂය තුල ධාවනයේ යොදවා නොතිබුණි. | වත්කම් වලින් නිසි ප්‍රයෝජනය ගැනීමට ක්‍රියා කළ යුතුවේ. | සේවකයන් බඳවා ගැනීමේදී අනුමත කාර්ය මණ්ඩලය තුළ බඳවා ගැනීම් සිදු කිරීමට සිදුවේ. සෞඛ්‍ය කම්කරුවන් ලෙස හෝ රියදුරු බල පත්‍ර ඇති අය බඳවා ගැනීමට කටයුතු කළද දිනක වැටුප රුපියල් දහසක් වැනි අඩු මුදලක් නිසා ඒ සඳහා අයදුම්කරුවන් ඉදිරිපත් නොවේ. |

3.4 ප්‍රසම්පාදන සැලැස්ම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදී රු. 20,058,912 ක ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබූ නමුත් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතුවේ. | 2019 වර්ෂය සඳහා 2019 පෙබරවාරි 08 දින මාසික මහා සභා රැස්වීම් තීර්ණ අංක ඉ - 14 යටතේ 2019 වර්ෂයට අදාලව සැපයුම් හා සේවාවන් ඉටු කිරීම සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සභා සම්මත කොට ඒ අනුව කටයුතු කරගෙන යමි. |

4. ගිණුම්කටයුතු භාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයන් සිදු කර නොතිබුණි. | අභ්‍යන්තර විගණනයන් සිදු කර සභාවේ අභ්‍යන්තර පාලනය ස්ථාපිත කළ යුතුවේ. | දැනට යථා පරිදි සිදු කරගෙන යනු ලැබේ. |

4.2 විගණන හා කළමනාකරණ කමිටු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අංක DMA/2009(1) හා 2009 ජූනි 09 දිනැති කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව පැවැත්විය යුතු විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් සමාලෝචිත වර්ෂය තුලදී පවත්වා නොතිබුණි. | විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුවේ. | 2018 තෙවැනි කාර්තුවේ සිට විගණන කළමනාකරණ රැස්වීම ත්‍රෛමාසිකව පැවැත්වීමට කටයුතු කර ඇත. |